**ඇල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශයතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයන් වලදී වැඩ නිම කර තිබුණු රු.33,652,262 ක් ගොඩනැගිලි යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී කඩා ඉවත් කර තිබුණු ඇල්ල පොලීසිය පාර කඩ කාමර 05 හි රු.6,500,000 ක තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මන්ත්‍රී දීමනා හා දුරකථන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණු රු.74,323 ක මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු ගමන් වියදම්, අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා රු.111,742 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා උපලේඛනවල ශේෂයන් අතර රු.2,267,931 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආරම්භක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය හා උපලේඛන අනුව ආරම්භක ශේෂය අතර රු.73,856,183 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ලෙජරයේ ගැලපුම් කර තිබුණු එකතු වටිනාකම් රු.348,759 ක නිවැරදිතාවය සනාථ කර ගැනීම සඳහා හඳුනාගත් වැරදි හෝ අඩුපාඩු පැහැදිලි කෙරෙන උපලේඛන හෝ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැරදි නිවැරදි කිරීමට අදාළ සටහන් නිවැරදිව පවත්වා ගත යුතුය. |
| (ආ) | එකතු වටිනාකම රු.95,882,634 ක් වූ වත්කම් විෂයයන් 7 ක ශේෂ තහවුරු කරගැනීම සඳහා වැඩ නිම් වාර්තා, අයිතිය තහවුරු කරන ලිපි, තක්සේරු වාර්තා, උපයෝගි පොත් සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | -එම- | ලේඛන හා උපලේඛන නිවැරදිව නඩත්තු කර නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 23 සහ 24 (1) වගන්ති | සභාවට අයත් මංමාවත් ස්ථිර සළකුණු සහ සීමා ලකුණු කර සැලසුම් පිළියෙල කර එම මංමාවත් සහ පටු මාවත්වල නාමලේඛනයක් දක්වමින් දැන්වීම් පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කාර්යයන් කඩිනමින් ඉටු කරන බව. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| | (ii)122 වගන්තිය | ප්‍රාදේශීය සභාවේ බලතල පාවිච්චි කිරීමේ සහ යුතුකම් ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී සභා සීමාව තුළ පවත්වාගෙන යන සම්භාහන | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථාන 11 ක් විධිමත් කිරීමට අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | | |
| (ආ) ප්‍රාදේශීය සභා 1988 මූල්‍ය හා පරිපාලන (රීති සංග්‍රහය) | | | |
| 218 රීතිය | සියළු ඉඩම් හා ගොඩනැඟිලි පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,419,693 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 4,873,204 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් බදු | 13,023,163 | 18,336,140 | 11,178,623 | 7,157,517 | 8,755,800 | 8,192,102 | 4,332,323 | **3,859,779** |
| **(ii)** | කුලී | 2,298,000 | 3,146,065 | 2,655,225 | 490,840 | 900,000 | 952,285 | 489,529 | **462,756** |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 1,806,000 | 2,014,950 | 2,014,950 | 0 | 1,572,200 | 985,000 | 985,000 | **0** |
| **(iv)** | වෙනත් ආදායම් | 8,940,000 | 6,321,328 | 6,275,978 | 45,350 | 17,767,000 | 17,022,080 | 6,163,800 | **10,858,280** |
| | එකතුව | **26,067,163** | **29,818,483** | **22,124,776** | **7,693,707** | **28,995,000** | **27,151,467** | **11,970,652** | **15,180,815** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 1877 කින් අයවිය යුතු රු.17,397,290 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණු අතර, හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 166 වගන්තියට අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ බදු නොගෙවන පුද්ගලයින් සඳහා නීතිමය පියවර ගන්නා බව. | හිඟහිටි වරිපනම් බදු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි කඩ කුලී රු.425,721 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | 2023 සැප්තැම්බර් මාසයේදී නීතිමය ක්‍රියාමාර්ග එක් කඩහිමියකු සඳහා ගෙන ඇති බව. | ගිවිසුම් අනුව හිඟ කඩ කුලී අයකර ගත යුතුය. |
| (ඇ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.1,022,490 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | හිඟ නිවේදනය නිකුත් කර ඇත. ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.6,547,100 ක් හා මුද්දර ගාස්තු රු.15,960,678 ක් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**පොදු මංමාවත් නඩත්තු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සංවර්ධනය කිරීම සභාවේ කාර්යයක් වුවද, ඇල්ල නගරයේ සිට ඇල්ල පොලිස් ස්ථානය අසළින් යන අතුරු මාර්ගය භාවිතයට අපහසු ලෙස හානි වී තිබුණද, මාර්ගය සංවර්ධනය කිරීමට සභාවේ අවධානය යොමුව නොතිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන්කර මාර්ගය කාපට් ඇතිරීමට සැලසුම් කරන බව. | ප්‍රාදේශීය සභා පනත අනුව පොදු මාර්ග සංවර්ධන කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී සභා අරමුදල් මගින් ඇල්ල සංචාරක නිවාසයේ පහත මහලේ එක් කාමරයක් නේවාසික කටයුතු සඳහා යෝග්‍ය වන පරිදි සංවර්ධනය කර තිබුණු අතර, 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම රු.45,000 ක අවම ආදායමක් පමණක් උපයා තිබුණි. | ගොඩනැගිල්ල සංවර්ධනය කර ඉදිරියේදී ආදායම් උපයා ගැනීමට අපේක්ෂා කරන බව. | අදාළ කාර්ය නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා සීමාව තුල පවත්වාගෙන යන ව්‍යාපාර ස්ථාන 483 ක් සඳහා 2023 වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට ලැබිය යුතු රු.433,000 ක ආදායම් අහිමි වී තිබුණි. | ස්ථිර ආදායම් පරීක්ෂකයෙකු නොමැතිවීම මේ සඳහා හේතුවක් වී ඇති බවත්, පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව. | සභාවේ කාර්යභාරය නිවැරදිව ඉටු කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියට අනුව රථවාහන නැවතුම් ස්ථාන සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වුවද, රාවණා ඇල්ල සහ දුම්රියපොළ අසල රථගාල් දෙකක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමකින් තොරව 2023 දෙසැම්බර් 31 දිනට රු.3,243,690 ක ආදායමක් අයකරගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ කුඹල්වෙල පිහිටි පැරණි සභා ගොඩනැඟිල්ල කිසිදු ආර්ථික කටයුත්තක් සඳහා භාවිතා නොකර 2018 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැඟිල්ල සංවර්ධන කටයුතු කරමින් පවතින බව. | ගොඩනැඟිලි ඵලදායි කාර්යයන් සඳහා යොදා ගත යුතුය. |
| (ආ) | සභාව විසින් භාවිතා කරනු ලබන බව්සරයක, කැබ් රථයක සහ ට්‍රැක්ටර් රථ 02 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ ගිවිසුම්ගතවී ඉදිකර තිබුණු ඇල්ල සංචාරක තොරතුරු මධ්‍යස්ථානය 2016 වර්ෂයේදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නිකුත් කර තිබුණු ඉදිකිරීම් යෝග්‍යතා සහතිකය අනුව, ප්‍රමාණවත් ඉසුලුම් ධාරිතාවයක් සහිත දෘඩ මව් පාෂාණ ස්ථරයක් මත ගොඩනැඟිල්ලේ කුළුණු පාදම් යෙදිය යුතු බවට නිර්දේශ කර තිබුණත්, භෞතික පරීක්ෂාව අනුව ගොඩනැඟිල්ලේ පාදම් සහිත වැඩ කොටස් ඉටු නොකර රු.6,599,634 ක් ගෙවා තිබුණි. | එකඟ වන බව. | නායයෑම් අවදානම් සහිත ප්‍රදේශයක් බැවින්, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබාගෙන ඉදිකිරීම් කළ යුතුය. |

(ආ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 6 ක් ඉක්ම වූ ඇල්ල සංචාරක නිවාස ගොඩනැඟිල්ල ඉදිකිරීම 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. කර්මාන්තය තරඟකාරී ලංසු කැඳවීම මත ලබාදිය යුතු වුවත් අදියර 03කට වෙන් කර අනුමත සමිතියකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධව සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | අදියරට (I) ට අදාළ කර්මාන්ත ලිපිගොනුව අස්ථානගත වී ඇති බව විගණනයට වාර්තා කර තිබුණි. ඒ අනුව ඉදිකිරීමට අදාළ අනුමත ඉංජිනේරු සැලැස්ම, ගොඩනැඟිලි සැලැස්ම, අනුමත ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන කටයුතු, ජාතික ගොඩනැඟිලි හා පර්යේෂණ ආයතනයෙන් ලබාගත් වාර්තා, නිම කර තිබුණු ඉදිකිරීම්වල ප්‍රගතිය සහ ගෙවීම් විස්තර සම්බන්ධව තහවුරු කර ගැනීමට ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වන බව. | ඉදිකිරීම් වලට අදාළ ලිපිගොනුව පවත්වාගෙන යා යුතුය. |
| (ii) | අදියර (II) යටතේ ගොඩනැඟිල්ලේ බිම් මහල සහ තවත් මහල් 02 කින් ඉදිකිරීමට අනුමත සමිතිය සමඟ රු.1,894,795 ක ගිවිසුමකට එළඹ තිබුණි. ගොඩනැඟිල්ලේ පළමු මහලේ කුළුණු ඉදිකිරීම සහ දෙවන මහලේ කොන්ක්‍රීට් තට්ටුව (Slab) පමණක් ඉදිකර තිබුණි. | එකඟ වන බව. | සැලසුම් අනුව විධිමත්ව වැඩ නිම කළ යුතුය. |
| (iii) | අදියර (III) යටතේ 2017 වර්ෂයේ ඔක්තෝබර් සිට 2018 ජනවාරි දක්වා කාල පරිච්ඡේදයට රු.1,994,048 ක් අනුමත සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එහිදී ඉටුකළ වැඩ කොටස් වෙනුවෙන් රු.833,012 ක් වැයකර තිබුණු අතර, කර්මාන්ත ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වන බව. | -එම- |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඇල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය ආසන්නයේ තිබීම හේතුවෙන් නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සහ මහජනතාව විවිධ අපහසුතා හා පීඩාවන්ට ලක්වී තිබුණි. | 2025 වර්ෂයේ COICA ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කිරීමට නියමිත බව. | කසළ කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කළ යුතුය. |